SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB

වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ තියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත සඳහන් සහ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා නියමිත සුදුසුකම් ලත් කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අභ්‍යන්තර විගණක තනතුර - (II ශ්‍රේණිය) MM 1-1

රැකියා පිරිවිතරය :

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන් සඳහා

ගිණුම්කරණය හෝ වාණිජ්‍යය හෝ යන විෂයක් සම්බන්ධව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙහි (ICASL) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයෙහි (CIMA) I හා II අදියර විභාග සමත්වී තිබීම

සහ

උපාධිය හෝ වෘත්තීය සුදුසුකම ලබාගැනීමෙත් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අටම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ I ශ්‍රේණියේ කනිෂ්ඨ කළමනාකරණ තනතුරෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

ඉංග්‍රීසි සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය වේ.

වැටුප් පරිමාණය :

MM 1-1 02/2016 රු. 53,175/- රු. 1,375 x 10 - 1,910 x 15 - රු. 95,575/- (මාසිකව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව ආරම්භක මාසික වැටුප් පියවර 53,175/- හා රජයේ අනුමත අතෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 57,000/- පමණ ආරම්භක මාසික වැටුපක් හිමිවේ.

සහකාර තේ කොමසාරිස් තනතුර - (II ශ්‍රේණිය) MM 1-1

රැකියා පිරිවිතරය

තේ කොමසාරිස්වරයාගේ පාලනය, මග පෙන්වීම හා අධීක්ෂණයට යටත්ව, 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ පැවරී ඇති අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම හා 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 25 වගන්තිය යටතේ නිර්ණය කර ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

බාහිර අයදුම්කරුවන්

අ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්මය හෝ විද්‍යාව හෝ වාණිජ්‍යය හෝ ආර්ථික විද්‍යාව හෝ රාජ්‍ය / ව්‍යාපාර පරිපාලනය හෝ යන විෂයන්ට මුල්තැන දෙමින් ලබාගත් උපාධිය

සහ

එම සුදුසුකම් ලැබීමෙත් පසු රාජ්‍ය අංශයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද ලබා තිබීම

අභ්‍යන්තර අයදුම්කරුවන්

අ. ශ්‍රී ලංකා තේ මණ්ඩල සේවයේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවය

හෝ

ආ. ශ්‍රී ලංකා තේ මණ්ඩල සේවයේ සහකාර තේ කොමසාරිස් II ශ්‍රේණිය තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබා ගැනීම පිණිස පවත්වනු ලබන සීමිත තරග විභාගය සමත් ශ්‍රී ලංකා තේ මණ්ඩල සේවයේ අවම වශයෙන් වසර දහයක (10) ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති තේ උපදේශක / පරීක්ෂක කළමනාකරණ සහකාර (නාක්ෂණ) I ශ්‍රේණියේ නිලධාරීන්.

සැ. යු. ඉංග්‍රීසි සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය වේ.

වැටුප් පරිමාණය :

MM 1-1 02/2016 රු. 53,175/- රු. 1,375 x 10 - 1,910 x 15 - රු. 95,575/- (මාසිකව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව ආරම්භක මාසික වැටුප් පියවර 53,175/- හා රජයේ අනුමත අතෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 57,000/- පමණ ආරම්භක මාසික වැටුපක් හිමිවේ.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

පොදු කොන්දේසි :

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදු කරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ :

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ / ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ / ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

අයදුම් කිරීම :

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ www.srilankateaboard.lk වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කර ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2020 **ජූනි** 17 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574, ගාලු පාර, කොළඹ 03.

SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB SLTB

Source: Sunday Observer, Silumina (2020.05.31)